# මධ්‍යකාලීන යුගයේ කාසිවල භාවිත ස්වරූපය

ඩබ්.එම්. චින්තක සඳරුවන්

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
chinthakasandaruwan13@gmail.com

---

ශ්‍රී ලංකාව මූල්‍යමය වශයෙන් රුපියල් ශත ක්‍රමය 1872 සිට භාවිතයට පැමිණියද මෙරට මූල්‍ය ක්‍රමයේ ආරම්භය ක්‍රි.පූ.200- ක්‍රි.ව.200 අතර කාලයේ දක්වා දිගු වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ පොළොන්නරු යුගයෙන් පසුව භාවිත වූ කාසිවල භාවිත ස්වරූපය පිළිබඳව ලිඛිත මූලාශ්‍ර සහ ද්‍රව්‍යාත්මක සාධක මත පදනම්ව කරුණු විමසීම ය. අනුරාධපුර යුගය තුළ භාවිත වූ මෙම මූල්‍ය ක්‍රමය ක්‍රමයෙන් දියුණුවීමක් දැකගත හැකි අතර පොළොන්නරු යුගය වන විට පැහැදිලි වශයෙන්ම මූල්‍ය ක්‍රමයේ ස්ථාවරභාවයක් ඇති වූ බව පෙනේ. එය මූල්‍ය ක්‍රමයේ මෙන්ම ඊහා බැඳි සාමාජීය, ආර්ථික, දේශපාලන, බැංකු ක්‍රම මෙන්ම වෙළෙඳ කටයුතු ආදියේ ස්ථාවරභාවය පෙන්නුම් කරයි. මෙයට හොඳම නිදසුන වන්නේ මධ්‍යකාලීන යුගය තුළ භාවිතයට ගනු ලැබූ පොළොන්නරු, දඹදෙණි යුගයේ කාසි වේ.

පොළොන්නරු යුගයෙන් පසුව භාවිත වූ මෙම කාසි විශේෂය සිංහල තඹ මස්ස, සිංහල මසු, දඹදෙණි කාසි ලෙස හඳුන්වනු ලැබේ. ක්‍රි. ව. 1017 දී සොළී පාලනය රජරට ආක්‍රමණය කිරීමෙන් පසුව සොළී කාසි මූල්‍ය ක්‍රමය තුළ භාවිත විය. පළමුවන විජයබාහු රජු මෙරට එක්සේසත් කිරීමෙන් පසුව පැවති මූල්‍ය ක්‍රමය වෙනස් නොකොට එය දේශීය වශයෙන් වෙනසකට ලක්කර පවත්වා ගත් බව පෙනේ.

පොළොන්නරු යුගය වනවිට මෙරට දේශීය හා විදේශීය වශයෙන් වෙළෙඳ කටයුතු ස්ථාවර මට්ටමක පැවති බවත් විදේශීය තානාපති සේවය ද ක්‍රමවත් ලෙස පැවති බවත් පෙනේ. ගෝකණ්න වරාය මෙන්ම නූතනය වන විට පාසිකුඩා ආශ්‍රිත මුහුදු තීරයත් මෙකල වැදගත් වූ බව පෙනේ. එහෙයින්ම මූල්‍ය ක්‍රමයේ ස්ථාවරභාවයක් පවත්වා ගැනීම ඉතා වැදගත් විය. දොළොස්වන සියවසෙන් පසු යුගයේ දේශපාලන ස්ථාවරභාවය රඳවාගැනීම ද ඉතා වැදගත් වූ කරුණක් විය. පළමුවන විජයබාහු, පළමුවන පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල වැනි ප්‍රබල පාලකයන් හැරුණු කොට වෙනත් ප්‍රබල පාලකයන් බිහි නොවීම දේශපාලන අස්ථාවරත්වයට හේතු වී තිබේ. එහෙයින් දේශපාලන බල අධිකාරය රඳවා ගැනීම සඳහා ද මූල්‍ය ක්‍රමය යොදාගත් බව පෙනේ.

සාමාජීය වශයෙන් අඩ සියවසක් පුරාවට සොළී පාලනය තුළ ස්ථාවරව පැවති මූල්‍ය ක්‍රමය එක්වර වෙනස් කළ නොහැකි වූ හෙයින් පැවති ක්‍රමය සුළු වෙනසක් කරමින් භාවිතයට ගැනීම සිදුකර තිබේ. එමගින් සමාජීය මෙන්ම ආර්ථික වශයෙන් ද ඇතිවිය හැකි ගැටුම් අවම කරගැනීමට හැකි වන්නට ඇත. මධ්‍යකාලීන යුගය වනවිට මූල්‍ය ක්‍රමයේ ස්ථාවර භාවයක් පැවති බවත් එය පවත්වා ගෙන යාම සඳහා විශේෂ වූ ආයතන පද්ධතියක් හෙවත් බැංකු ක්‍රමයක් පවතින්නට ඇතැයි ද සිතිය හැකි ය. එයින් කාසි නියමිත ප්‍රමිතින්ට අනුව නිෂ්පාදනය, භාවිතයේ යෙදවීම මෙන්ම වෙනස්කම් ඇති කිරීම් සිදුකළ බවද පෙනේ. ඒ අනුව මූලික වශයෙන් මධ්‍යකාලීන යුගයේ කාසි තුළින් සමාජීය, ආර්ථික, දේශපාලනික, මූල්‍ය ආයතන පද්ධති ආදිය පිළිබඳව වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කරගැනීමට හැකියාව පවතියි. ඒ පිළිබඳව හෙළිකිරීම මෙම අධ්‍යයනයෙන් සිදුවෙයි.

ප්‍රමුඛ පද : මධ්‍යකාලීන යුගය, තඹ මසු කාසි, මූල්‍ය ක්‍රමය